**ශීර්ෂ 166 - ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය**
**විගණකාධිපති වාර්තාව 2013 වර්ෂය**

---

**විගණන විෂය පථය**

---

ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 ඔක්තෝබර් 31 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන නිරීක්ෂණය

---

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.11 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) විගණන විමසුම්වලට පිළිතුරුදීම

---

අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 10 න් 2 කට 2014 නොවැම්බර් 25 දින වන විටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

## (ආ) විසර්ජන ගිණුම

### (i) මුළු ප්‍රතිපාදනය හා වියදම

ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.34,958,700,000 ක් වු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.26,075,754,237 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.8,882,945,763 ක් හෙවත් සියයට 25.4 ක් ඉතිරිවී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2013 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 187,700,000 | 187,140,095 | 559,905 | 0.3 |
| මූලධන | 34,771,000,000 | 25,888,614,142 | 8,882,385,858 | 25.5 |
| **එකතුව** | **34,958,700,000** | **26,075,754,237** | **8,882,945,763** | **25.4** |

### (ii) අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- වැය විෂයයන් 9 ක් සඳහා සළසා තිබුණු රු. 895,200,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.
- වැය විෂයයන් 24 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 21 සිට සියයට 98 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.
- වැය විෂයයන් 2 ක් සඳහා සළසා තිබුණු ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන බව ප්‍රකාශ කර මුදල් රෙගුලාසි 66 ප්‍රකාරව වෙනත් වැය විෂයයන්ගෙන් එකතුව රු.9,300,000 ක ප්‍රතිපාදන ලබා ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට එසේ ලබාගත් ප්‍රතිපාදන උපයෝජනය නොකර මුළුමණින්ම ඉතිරි වී තිබුණි.
- වැය විෂයයන් 6 ක් සඳහා මුදල් රෙගුලාසි 66 ප්‍රකාරව වෙනත් වැය විෂයයන්ගෙන් එකතුව රු.1,262,300,000 ක ප්‍රතිපාදන ලබා ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට එම වැය විෂයයන් 6 සඳහා සළසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය රු.1,467,171,658 ක් වී තිබුණි. ඒ අනුව එම වැය විෂයයන් 6 සඳහා වෙනත් වැය විෂයයන්ගෙන් ලබාගත් රු.1,262,300,000 ක මුළු ප්‍රතිපාදනය උපයෝජනය නොකර ඉතිරි කර තිබුණි.

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

2005 දෙසැම්බර් 10 දින සිට වැඩ තහනමට ලක් වූ නිලධාරියෙකුගෙන් අය විමට තිබුණු රු.38,095 ක ණය ශේෂය සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි

**1.4 වත්කම් කළමනාකරණය**

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ)** 2013 වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර තිබුණත්, අමාත්‍යාංශයේ ගබඩාවේ ඉන්වෙන්ට්‍රි ලේඛන 2013 දෙසැම්බර් 31 දිනට ශේෂ කර නොතිබුණි.

(ආ) ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සමීක්ෂණයේදී සමහර භාණ්ඩවල තථ්‍ය ශේෂය පමණක් දක්වා තිබූ අතර සමහර භාණ්ඩවල ඉන්වෙන්ට්‍රි පොත අනුව ශේෂය හා තථ්‍ය ශේෂය සඳහන් නොකර ඌනතා හා අතිරික්තතා සඳහන් කර තිබුණි.

**1.5 වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සතු වාහන 11 ක් අමාත්‍යාංශය විසින් පරිහරණය කර තිබුණු අතර එම වාහන සඳහා 2013 වර්ෂයේදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් රක්ෂණය, ආදායම් බලපත්‍ර, අළුත්වැඩියා හා ඩීසල් බදු වෙනුවෙන් රු.1,108,584 ක් වැය කර තිබුණි.

**1.6 පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

විදේශාධාර යටතේ ක්‍රියාත්මක වූ ප්‍රජා ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය සහ ලුනාව පරිසර ප්‍රවර්ධන ව්‍යාපෘතිය යන ව්‍යාපෘති දෙකට අයත් වාහන 18 ක් සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශයේ කටයුතු වෙනුවෙන් යොදා ගෙන තිබුණි.

**1.7 අනුකූල නොවීම**

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති, හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| **(අ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | |
| (i) | මුදල් රෙගුලාසි අංක 1645(අ) | අමාත්‍යාංශයේ වාහන වෙනුවෙන් ලොග් සටහන් පොත් විධිමත් පරිදි පවත්වා නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි අංක 1646 | වාහන භාර නිලධාරී විසින් අමාත්‍යාංශය සතු සංචිත වාහනවල දෛනික ධාවන සටහන් හා මාසික සංසිද්ධි වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| **(ආ)** | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | |
| | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛය | සෑම මාස 06 ට වරක් වාහනවල ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂා කර නොතිබුණි. |
| **(ඇ)** | **භාණ්ඩාගාර චක්‍රලේඛ** | |
| | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන චක්‍රලේඛය | පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| **(ඇ)** | **ජාතික අයවැය චක්‍රලේඛ** | |
| | 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන චක්‍රලේඛයේ 1.1.6 ජේදය හා 1.1.7 ජේදය | ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගේ හිඟහිටි ණය ශේෂය මාස 2 ක් ඇතුළත ස්ථානමාරු වී ගිය ආයතනනයෙන් අයකර ගත යුතු අතර එසේ නොවන විට තෙවන මාසයේදී එය අමාත්‍යාංශය විසින් මාසික ගිණුම් සාරාංශ මගින් අදාල ආයතනයෙන් අය කර ගත යුතුය. අමාත්‍යාංශයෙන් ස්ථාන මාරුවීම් ලබා ගිය නිලධාරීන් 5 දෙනෙකුගෙන් එකතුව රු.767,158 ක ණය ශේෂ එසේ අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි. |

**1.8 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා**

මහා පරිමාණ ව්‍යාපාති 07 ක් සඳහා මූලාශ්‍ර 17 කින් රු.1,119,800,000 ක අරමුදල් සපයා තිබුණි. 2013 වර්ෂයේදී රු.2,881,200,000 ක ප්‍රතිපාදන සළසා තිබුණු මහා පරිමාණ ජල සම්පාදන ව්‍යාපෘති 07 ක් ආරම්භ කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී එම ව්‍යාපෘති 07 වෙනුවෙන් පරිපාලන වියදම් ලෙස රු.289,769,029 ක් වැය කර තිබුණි.

**1.9 අවිධිමත් ගනුදෙනු**

සනීපාරක්ෂාව පිළිබඳ දකුණු ආසියානු සමුළුව (SACOSAN) සඳහා වූ වැය විෂයක සමාලෝචිත වර්ෂය අවසානයේ දී ඉතිරි වී තිබුණු ප්‍රතිපාදනයෙන්, අවශ්‍යතාවය පිළිබද සැලකිල්ල යොමු නොකර 2013 දෙසැම්බර් 31 දිනම මිල ගණන් කැඳවා අමාත්‍යාංශය සඳහා පරිගණක 04 ක් හා ලැප්ටොප් පරිගණක 02 ක් එදිනම රු.363,760 කට මිලදී ගෙන තිබුණි.

**1.10 කළමනාකරණ දුර්වලතා**

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) ව්‍යාපෘති අවසන් වීමෙන් පසු අමාත්‍යාංශය වෙත භාරදෙනු ලබන වාහන සම්බන්ධයෙන් භාරදුන් දිනය, වාහන අංකය, වාහන වර්ගය, මිලදීගත් වර්ෂය යනාදි විස්තර ඇතුළත් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි.

(ආ) ව්‍යාපෘති 02 කට අයත් ගර්හිත වාහන 17 ක් අමාත්‍යාංශ භූමියේ ගාල් කර තිබූ අතර ඒවා නිසි පරිදි අමාත්‍යාංශයට පවරා නොගැනීම නිසා වෙන්දේසි කිරීමට නොහැකිවී තිබුණි.

(ඇ) විසර්ජන ගිණුමේ ජංගම නොවන වත්කම් සංචලන පිළිබඳ වාර්තාවේ ගොඩනැගිලි හා ඉදිකිරීම් (2104) යටතේ 2013 වර්ෂයේ එකතුවීම් ලෙස රු.149,699 ක් පෙන්නුම්කර තිබුණත් විගණිත දිනය වූ 2014 මැයි 02 දින වන විටත් අදාල ගරාජ් කුටි 03 ඉදිනොකර ඒ සඳහා මිලදී ගත් ඉදිකිරීම් ද්‍රව්‍ය අමාත්‍යාංශ භූමියේ ගොඩගසා තිබුණි.

(ඈ) මහජනයා විසින් ජලය හා ජලයට සම්බන්ධව ඉදිරිපත් කරන ලද පෙත්සම් සම්බන්ධව නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර 2013 වර්ෂයේදී ලැබුණු මහජන පැමිණිලිවලට 2014 ඔක්තෝබර් මාසය අවසන් වන විටත් ප්‍රමාණවත් පරිදි ප්‍රතිචාර දක්වා නොමැති බව පහත දක්වා ඇති තොරතුරුවලින් තහවුරු විය. ඊට අමතරව 2013 වර්ෂයේදී ලද මහජන පැමිණිලි 103 ක් ජල භාරය වෙත යොමු කර තිබුණත් ඒ සඳහාද පිළිතුරු ලබාදී නොතිබුණි.

| මහජන පැමිණිලිවල ස්වභාවය | මහජන පැමිණිලි සංඛ්‍යාව | පිළිතුරු සැපයූ මහජන පැමිණිලි සංඛ්‍යාව | පිළිතුරු සපයා නැති මහජන පැමිණිලි සංඛ්‍යාව | පිළිතුරු සපයා නැති මහජන පැමිණිලි සංඛ්‍යාවේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| **පෞද්ගලික ජල ඉල්ලීම්** | | | | |
| මධ්‍යම පළාත | 52 | 34 | 18 | 35 |
| දකුණු පළාත | 46 | 14 | 32 | 70 |
| දිවයිනටම | 256 | 163 | 93 | 36 |
| **දෝෂ සහිත ජල ගාස්තු** | | | | |
| - දිවයිනටම | 29 | 17 | 12 | 41 |
| **නව ජල යෝජනා ක්‍රම** | | | | |
| - දිවයිනටම | 37 | 19 | 18 | 49 |
| **නව ජල යෝජනා ක්‍රම දීර්ඝ කිරීම හා වැඩිදියුණු කිරීම** | | | | |
| - දිවයිනටම | 72 | 27 | 45 | 63 |

## 1.11 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 25 | 15 | 10 |
| තෘතියික මට්ටම | 04 | 03 | 01 |
| ද්විතියික මට්ටම | 82 | 60 | 22 |
| ප්‍රාථමික මට්ටම | 39 | 27 | 12 |
| **එකතුව** | **150** | **105** | **45** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 45 ක් පිරවීමට ආයතනය අපොහොසත් වී තිබුණි.

**(ආ) වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත්**

**------------------------------------------------------------**

විධිමත් අනුමැතියකින් තොරව වෙනත් ආයතන දෙකක සේවකයින් පස්දෙනෙකු අමාත්‍යාංශයෙහි සේවයේ යොදවා තිබුණු අතර ඒම සේවකයන්ට වැටුප් හා වේතන අදාල ආයතනයන් විසින් ගෙවා තිබු බව අනාවරණය විය.